# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 878/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 23/05/2024 පැය 2010

## මාධ්‍ය නිවේදනය

**යතුරුපැදියක් දුම්රියක ගැටී පුද්ගලයින් තිදෙනෙකු මියයාම - රත්ගම පොලිස් වසම.**

2024.05.23 වන අද දින සවස් කාලයේ රත්ගම පොලිස් වසමේ පින්තාලිය හන්දිය අසල දුම්රිය හරස් මාර්ගයේදී කොළඹ සිට මාතර දක්වා ධාවනය වූ සීඝ්‍රගාමී දුම්රියක යතුරු පැදියක් ගැටි ඇති බවට ලද පණිවිඩයකට අනුව රත්ගම පොලිසිය විමර්ශනයක් ආරම්භ කර ඇත.

එම අවස්ථාවේ යතුරු පැදියේ පැදිකරු හා පසු පැදිකරුවන් දෙදෙනෙකු ගමන් කර ඇති අතර යතුරු පැදියේ පැදිකරු එම ස්ථානයේදීම මියගොස් ඇත. පසු පැදිකරුවන් දෙදෙනා කරාපිටිය රෝහලට ඇතුළත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරුවන් වයස අවුරුදු 17,18 හා 19 වයස් වල පසුවන කැකිල්ලමණ්ඩිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෘත ශරීර කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර රත්ගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**